# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2024 ජූලි 31 |


# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

## 2024 ජූනි

තරමක ඉහළ වෙළෙඳ හිඟයක් පැවතිය ද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් සහ සංචාරක ඉපැයීම් ඉහළ යෑම සමඟ 2024 වසරේ පළමු භාගයේ දී විදේශ අංශයේ ක්‍රියාකාරීත්වය ධනාත්මකව පැවpතුනි.

## විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ

**2024 ජූනි:**

එ.ජ.ඩො. මිලියන **520**



**11.4 %**
ජන. - ජූනි

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ,** 2023 වසරේ ජනවාරි-ජූනි කාලපරිච්ඡේදය තුළ දී වූ එ.ජ.ඩො. මිලියන **2,823**ට සාපේක්ෂව 2024 වසරේ ජනවාරි-ජූනි කාලපරිච්ඡේදය තුළ දී එ.ජ.ඩො. මිලියන **3,144**ක් විය.

## දළ නිල සංචිත*




** චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වේ.*

දළ නිල සංචිත 2024 වසරේ ජූනි මාසය අවසානය වන විට එ.ජ.ඩො. බිලියන **5.7**ක් විය.

## භාණ්ඩ වෙළඳාමේ ක්‍රියාකාරිත්වය

| 2024 ජූනි | 2024 ජන. - ජූනි |
|---|---|
| අපනයන: එ.ජ.ඩො. මිලියන **1,077** | අපනයන: එ.ජ.ඩො. මිලියන **6,144** |







| 2024 ජූනි | 2024 ජන. - ජූනි |
|---|---|
| ආනයන: එ.ජ.ඩො. මිලියන **1,447** | ආනයන: එ.ජ.ඩො. මිලියන **8,684** |

**වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය** 2024 වසරේ ජූනි මාසයේ දී වාර්ෂික ලක්ෂමය පදනම මත පුළුල් වුවද, 2024 වසරේ මැයි මාසයට සාපේක්ෂව පහළ ගියේය.

## සංචාරක ඉපැයීම්

2024 වසරේ ජනවාරි-ජූනි කාලපරිච්ඡේදය තුළ දී **සංචාරක ඉපැයීම්** එ.ජ.ඩො. මිලියන **1,557**ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, 2023 වසරේ ජනවාරි-ජූනි කාලපරිච්ඡේදය තුළ දී එ.ජ.ඩො. මිලියන **875**ක් ලෙස වාර්තා විය.




## විනිමය අනුපාතිකය







**එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල,** 2024 වසරේ ජූනි මාසය දක්වා අතිප්‍රමාණය විය.

## සේවා අංශය වෙත වූ ලැබීම්

(සංචාරක ඉපැයීම් හැර)




**සේවා අංශය වෙත වූ ලැබීම් (සංචාරක ඉපැයීම් හැර)** 2023 වසරේ ජන.-ජූනි කාලපරිච්ඡේදය තුළ දී වූ එ.ජ.ඩො. මිලියන **1,561**ට සාපේක්ෂව 2024 වසරේ ජන.-ජූනි කාලපරිච්ඡේදය තුළ දී එ.ජ.ඩො. මිලියන **1,762**ක් විය.

## රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ (ශුද්ධ)

2024 වසරේ ජූනි මාසයේ දී **රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශ ආයෝජන** ශුද්ධ ගෙවීම් අඛණ්ඩව වාර්තා විය.

| 2024 ජූනි | 2024 ජන. - ජූනි |
|---|---|
| ශුද්ධ: එ.ජ.ඩො. මිලියන **-39** | ශුද්ධ: එ.ජ.ඩො. මිලියන **-198** |







| 2024 ජූනි | 2024 ජන. - ජූනි |
|---|---|
| **ලැබීම්:** එ.ජ.ඩො. මිලියන **10** | **ලැබීම්:** එ.ජ.ඩො. මිලියන **213** |
| **ගෙවීම්:** එ.ජ.ඩො. මිලියන **48** | **ගෙවීම්:** එ.ජ.ඩො. මිලියන **411** |

## කොළඹ කොටස් වෙළඳපොළ (ශුද්ධ)

| 2024 ජූනි | 2024 ජන. - ජූනි |
|---|---|
| ශුද්ධ: එ.ජ.ඩො. මිලියන **-3** | ශුද්ධ: එ.ජ.ඩො. මිලියන **20** |







**කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන** 2024 වසරේ ජනවාරි-ජූනි කාලපරිච්ඡේදය තුළ දී ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

## වෙළඳ භාණ්ඩ ගිණුමේ ශේෂය

2024 වසරේ පළමු අර්ධය තුළ වෙළඳ ගිණුමේ සමස්ත හිඟය 2023 වසරේ පළමු අර්ධය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,289ක හිඟයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 2,540ක හිඟයක් දක්වා පුළුල් විය. මේ අතර, වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය 2024 වසරේ ජූනි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 370ක් දක්වා සුළු වශයෙන් පුළුල් විය.

**රූප සටහන 1: මාසික අපනයන ආදායම**




**රූප සටහන 2: මාසික ආනයන වියදම**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය[1]

**2024 වසරේ පළමු අර්ධය තුළ වෙළඳ භාණ්ඩ අපනයන ආදායම පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 6,144ක් දක්වා සියයට 4.7කින් ඉහළ ගියේය.** මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, රබර් නිෂ්පාදිත, සහ තේ ආදී වූ අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. මේ අතර, අපනයන ආදායම, 2023 වසරේ ජූනි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,005ට සාපේක්ෂව 2024 වසරේ ජූනි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,077ක් දක්වා සියයට 7.1කින් ඉහළ ගියේය. සියලුම ප්‍රධාන අපනයන කාණ්ඩවල ඉපැයීම් ඉහළ ගිය අතර එහිදී කාර්මික අපනයන වැඩි වශයෙන් ඉහළ ගියේය.

2024 වසරේ ජූනි මාසයේ දී **කාර්මික භාණ්ඩ** අපනයනයන්හි ඉහළ යෑම සඳහා නැව් සහ ගුවන් යානා ඉන්ධන අපනයන පරිමා ඉහළ යෑම හේතුවෙන් ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය. 2024 වසරේ ජූනි මාසයේ දී **කෘෂිකාර්මික භාණ්ඩ** අපනයන ආදායම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් කුළුබඩු (මූලිකව, ඉහළ ගම්මිරිස් පරිමාවන්) සහ (මූලිකව, ඉහළ මිල ගණන්) අපනයනය ඉහළ යෑම දායක විය. **ඛනිජ** අපනයන ආදායම ද 2024 වසරේ ජූනි මාසයේදී ඉහළ ගියේය.

[1] වෙළඳ භාණ්ඩ සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වර්ගීකරණය සහ සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයේ සිව්වන සංස්කරණය පදනම් කර ගත් සංයුතීන්, පිළිවෙළින්, ඇමුණුම II, ඇමුණුම III, ඇමුණුම IV සහ ඇමුණුම V හි දක්වා ඇත.

**රූප සටහන 3: අපනයන සංයුතිය**

**2024 ජුනි : එ.ජ. ඩො. මිලියන 1,077**
2023 ජුනි : එ.ජ. ඩො. මිලියන 1,005

**2024 ජන. - ජුනි : එ.ජ. ඩො. මිලියන 6,144**
2023 ජන. - ජුනි : එ.ජ. ඩො. මිලියන 5,871




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය[1]

**2024 වසරේ පළමු අර්ධය තුළ වෙළඳ භාණ්ඩ ආනයන වියදම පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 8,684ක් දක්වා සියයට 6.4කින් ඉහළ ගියේය.** මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් යන්ත්‍රසූත්‍ර හා උපකරණ, රෙදිපිළි සහ රෙදිපිළි උපාංග, රසායනික නිෂ්පාදිත, සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආදී වූ ආනයන හේතු විය. මේ අතර, ආනයන වියදම 2023 වසරේ ජුනි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,369ට සාපේක්ෂව 2024 වසරේ ජුනි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,447ක් දක්වා සියයට 5.7කින් ඉහළ ගියේය. ආනයන වියදමේ මෙම ඉහළ යෑම සඳහා අන්තර් සහ ආයෝජන භාණ්ඩවල වියදම දායක වූ අතර පාරිභෝගික භාණ්ඩ ආනයනයේ අඩුවීමක් වාර්තා විය.

**රූප සටහන 4: ආනයන සංයුතිය**

**2024 ජුනි: එ.ජ. ඩො. මිලියන 1,447**
2023 ජුනි: එ.ජ. ඩො. මිලියන 1,369

**2024 ජන. - ජුනි: එ.ජ. ඩො. මිලියන 8,684**
2023 ජන. - ජුනි : එ.ජ. ඩො. මිලියන 8,161




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

2024 වසරේ ජූනි මාසයේ **පාරිභෝගික භාණ්ඩ** ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව අඩුවීම සඳහා ආහාර පාන ආනයන වියදම් (මූලික වශයෙන් කිරිඟු පිටි සහ ආහාරයට ගත හැකි තෙල් ආනයනය) සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ (මූලික වශයෙන් බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත) යන දෙඅංශයේම ආනයනයේ අඩු වීම හේතු විය. මේ අතර, 2023 වසරේ ජූනි මාසයට සාපේක්ෂව ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයනය වියදම ඉහළ යෑම **අන්තර් භාණ්ඩ** ආනයන වියදම් ඉහළ යෑමට මූලික වශයෙන් හේතු විය. කෙසේ වුවද, මූල ලෝහ සහ තිරිඟු සඳහා වූ වියදම 2024 වසරේ ජූනි මාසයේදී සැලකිය යුතු ලෙස පහළ ගියේය. **ආයෝජන භාණ්ඩ** සඳහා වූ වියදම පුළුල් වශයෙන් ඉහළ ගිය අතර යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම ඉහළ යෑම මූලික වශයෙන් හේතු විය.

## වෙළඳ දර්ශක[2]

අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන **වෙළඳ මිල අනුපාතය**, 2023 වසරේ පළමු අර්ධයට සාපේක්ෂව 2024 වසරේ පළමු අර්ධය තුළ දී සියයට 0.9 කින් වර්ධනය විය. කෙසේ වුවද, 2023 වසරේ ජූනි මාසයට සාපේක්ෂව 2024 වසරේ ජූනි මාසයේ දී වෙළඳ මිල අනුපාතය සියයට 2.5කින් පහළ ගිය අතර, ඒ සඳහා ආනයන මිල ගණන් පහළ යෑමේ වේගයට වඩා වැඩි වේගයකින් අපනයන මිල ගණන් පහළ යෑම හේතු විය.

2024 වසරේ ජූනි මාසයේ දී අපනයන ආදායම 2023 වසරේ ජූනි මාසයට සාපේක්‍ෂව ඉහළ යෑම සඳහා අපනයන පරිමාව ඉහළ යෑම හේතු වූ බව නිරූපණය කරමින් අපනයන පරිමා දර්ශකය සියයට 10.8කින් ඉහළ ගිය අතර, අපනයන ඒකක මිල දර්ශකය සියයට 3.4කින් පහළ ගියේය.

එසේම, 2024 වසරේ ජූනි මාසයේ දී ආනයන වියදම 2023 වසරේ ජූනි මාසයට සාපේක්‍ෂව ඉහළ යෑම සඳහා ද ඉහළ පරිමාවන් හේතු වූ බව නිරූපණය කරමින් ආනයන පරිමා දර්ශකය සියයට 6.5කින් ඉහළ ගිය අතර, ආනයන ඒකක මිල දර්ශකය සියයට 0.8කින් පහළ ගියේය.

**රූප සටහන 5: වෙළඳ මිල අනුපාතය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 6: අපනයන පරිමා සහ ඒකක මිල දර්ශක**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: ආනයන පරිමා සහ ඒකක මිල දර්ශක**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

[2] එ.ජ. ඩොලර් වටිනාකම අනුව

## සේවා අංශයේ ක්‍රියාකාරීත්වය[3]

**සංචාරක ඉපැයීම් :** සංචාරක ඉපැයීම්, 2023 වසරේ පළමු භාගයේ දී ඇස්තමේන්තු කළ එ.ජ.ඩො. මිලියන 875ට සාපේක්ෂව 2024 වසරේ පළමු භාගයේ දී එ.ජ.ඩො. මිලියන 1,557ක් ලෙස ඇස්තමේන්තු ගත කර ඇත. 2024 වසරේ ජූනි මාසයේ දී සංචාරක ඉපැයීම්, 2024 වසරේ මැයි මාසය සඳහා ඇස්තමේන්තු කළ එ.ජ. ඩොලර් මිලියන 154ට සහ 2023 වසරේ ජූනි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 123ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 151ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**රූප සටහන 8: මාසික සංචාරක ඉපැයීම්**




**මූලය:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: මාසික සංචාරක පැමිණීම්**




**මූලය:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**සේවා අංශයේ අනෙකුත් ලැබීම්[4] :** 2024 වසරේ පළමු භාගය තුළ දී සේවා අංශය (සංචාරක ඉපැයීම් හැර) වෙත වූ මුළු ලැබීම්, 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,561ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,762ක් ලෙස ඇස්තමේන්තු ගත කර ඇත. 2024 වසරේ පළමු භාගය තුළ දී සේවා අංශය වෙත වූ අනෙකුත් ලැබීම් (සංචාරක අංශය හැර) ඉහළ යාමට ප්‍රධාන වශයෙන් දායක වූයේ මුහුදු ප්‍රවාහන සහ පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවාවන්ය. 2024 වසරේ ජූනි මාසයේ දී සේවා අංශය (සංචාරක ඉපැයීම් හැර) වෙත වූ මුළු ලැබීම් 2023 වසරේ ජූනි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 247ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 285ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත. 2024 වසරේ ජූනි මාසයේ දී සේවා අංශය (සංචාරක ඉපැයීම් හැර) වෙත වූ ලැබීම් ඉහළ යාමට ප්‍රධාන වශයෙන් දායක වූයේ මුහුදු ප්‍රවාහන සේවාය.

---

[3] ශ්‍රී ලංකා මහ බැංකුව සිය අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය (ITRS) මත පදනම්ව, උප කාණ්ඩවල දත්ත ද ඇතුලත් වන පරිදි, 2024 වසරේ ජනවාරි මාසයේ සිට සේවා අංශයේ සංඛ්‍යාලේඛන මාසිකව වාර්තා කිරීම ආරම්භ කරන ලදී.

[4] තාවකාලික

### රූප සටහන 10: සේවා අංශය වෙත වූ ප්‍රධාන ලැබීම් (සංචාරක ඉපැයීම් හැර)

**2024 ජුනි: එ.ජ. ඩො. මිලියන 285**

2023 ජුනි: එ.ජ. ඩො. මිලියන 247

**2024 ජන. - ජුනි: එ.ජ. ඩො. මිලියන 1,762**

2023 ජන. - ජුනි: එ.ජ. ඩො. මිලියන 1,561




**මූලය:** අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව

**සේවා අංශයේ ගෙවීම්**[4] **:** 2024 වසරේ පළමු භාගය තුළ දී සේවා අංශය වෙතින් වූ මුළු ගෙවීම්, 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 987ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,505ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත. 2024 වසරේ පළමු භාගය තුළ දී සේවා අංශය වෙතින් වූ ගෙවීම් ඉහළ යාමට ප්‍රධාන වශයෙන් දායක වූයේ විදේශ සංචාර, මුහුදු ප්‍රවාහනය, තාක්‍ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ වෙනත් ව්‍යාපාරික සේවා, නිෂ්පාදන සේවා සහ ඉදිකිරීම් සේවාවන්ය. 2024 වසරේ ජුනි මාසයේ දී සේවා අංශය වෙතින් වූ මුළු ගෙවීම්, 2023 වසරේ ජුනි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 185ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 238ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත. 2024 වසරේ ජුනි මාසයේ දී සේවා අංශය වෙතින් වූ ගෙවීම් ඉහළ යාමට ප්‍රධාන වශයෙන් දායක වූයේ විදේශ සංචාර සහ ගුවන් ප්‍රවාහන සේවාවන්ය.

### රූප සටහන 11: සේවා අංශයේ ප්‍රධාන ගෙවීම්

**2024 ජුනි: එ.ජ. ඩො. මිලියන 238**

2023 ජුනි: එ.ජ. ඩො. මිලියන 185

**2024 ජන. - ජුනි: එ.ජ. ඩො. මිලියන 1,505**

2023 ජන. - ජුනි: එ.ජ. ඩො. මිලියන 987




**මූලය:** අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව

[4] තාවකාලික

## විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ

විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2023 වසරේ පළමු භාගය තුළ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,823ට සාපේක්ෂව 2024 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 3,144ක් ලෙස වාර්තා වූ අතර, 2024 වසරේ ජූනි මාසයේ දී අඛණ්ඩව සිව්වන මාසයටත් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 500ට වඩා ඉහළ අගයක පැවතුනි. 2024 වසරේ ජූනි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 520ක් ලෙස වාර්තා විය.

**රූප සටහන 12: මාසික විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන්: බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්

2024 වසරේ ජූනි මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි එ.ජ. ඩොලර් මිලියන 39ක විදේශ ආයෝජනවල ශුද්ධ ගෙවීමක් වාර්තා වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2024 වසරේ පළමු භාගයේ දී එ.ජ. ඩොලර් මිලියන 198ක සමුච්චිත ශුද්ධ ගෙවීමක් වාර්තා විය. මේ අතර, ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත්, කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශීය ලැබීම්, 2024 වසරේ පළමු භාගයේ දී එ.ජ. ඩොලර් මිලියන 20ක සමස්ත ශුද්ධ ලැබීමක් වාර්තා කළ ද 2024 වසරේ ජූනි මාසයේ දී ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. මෙම සමුච්චිත ශුද්ධ ලැබීම, ප්‍රාථමික වෙළඳපොළ වෙත වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 48ක ශුද්ධ ලැබීම සහ ද්විතීයික වෙළඳපොළ වෙතින් වූ එ.ජ. ඩොලර් මිලියන 28ක ශුද්ධ ගෙවීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයකි.

## ජාත්‍යන්තර සංචිත

දළ නිල සංචිත 2023 වසරේ දෙසැම්බර් මාසය අවසන් වන විට පැවති එ.ජ. ඩොලර් බිලියන 4.4 සිට 2024 වසරේ ජූනි මාසය අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 5.7ක් දක්වා ඉහළ ගියේය. චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකම සංචිතවලට ඇතුළත් වූ අතර, එය භාවිතා කිරීමේ දී ඇතැම් කොන්දේසිවලට යටත් වේ. 2024 වසරේ මැයි මස අවසානයේ සිට දළ නිල සංචිත ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මාස 48ක විස්තීරණ අරමුදල් පහසුකම (EFF) යටතේ දෙවන සමාලෝචනය අවසන් කිරීමෙන් පසු ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 336ක් ලබා දීමයි. 2024 වසරේ ජූනි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 57ක් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ වෙත ශුද්ධ පදනම මත සපයා තිබුණ ද, 2024 වසරේ පළමු මාස හය තුළ දී මහ බැංකුව විසින් ශුද්ධ පදනම මත සිදු කළ මිලදී ගැනීම් එ.ජ. ඩොලර් බිලියන 1.8 ක් විය. මේ අතර, දළ නිල සංචිත (චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම ඇතුළත්ව) මගින් ආවරණය කළ හැකි ආනයන ප්‍රමාණය 2024 වසරේ ජූනි මස අවසන් වන විට ආනයනික මාස 3.9ක් විය.

**රූප සටහන 13: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයෙහි හැසිරීම

ශ්‍රී ලංකා රුපියල 2024 වසරේ ජූලි මාසය තුළ දී විටින් විට යම් විචලනයන් පෙන්නුම් කළද පුළුල් ලෙස ස්ථාවරව පැවතුනි. 2024 වසරේ ජූලි මස 31 දක්වා වසර තුළ දී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 7.1කින් අතිප්‍රමාණය විය. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2024 වසරේ ජූලි මස 31 දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල යූරෝ, ස්ටර්ලින් පවුම, චීන යුවාන්, ජපන් යෙන්, ඉන්දියානු රුපියල, සහ ඕස්ට්‍රේලියානු ඩොලරය වැනි අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට සාපේක්ෂව අතිප්‍රමාණය විය. ශ්‍රී ලංකා රුපියලෙහි වූ නාමික අතිප්‍රමාණයට අනුකූලව 2024 වසරේ ජූනි මස දක්වා වසර තුළ දී මුදල් වර්ග 24කින් සැදුම් ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) අතිප්‍රමාණය විය. ඒ අනුව, මෙම කාලපරිච්ඡේදය තුළ දී විදේශීය තරඟකාරීත්වයෙහි අඩු වීමක් පිළිඹිබු කරමින්, මූ.ස.වි.අ. 24හි දර්ශකය 2023 වසරේ දෙසැම්බර් මස අවසාන වන විට පැවති 70.2 සිට 2024 වසරේ ජූනි මස අවසාන වන විට 75.2ක් දක්වා ඉහළ ගියේය.

**රූප සටහන 14: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස් වීම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 15: විනිමය අනුපාතිකයෙහි සහ මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකයෙහි වෙනස් වීම**

**(2023 වසරේ දෙසැම්බර් මස අවසානයේ සිට 2024 වසරේ ජූනි මස අවසානය දක්වා)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 1: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස් වීම***

| මුදල් ඒකකය | 2022 | 2023 | 2024 (ජූලි 31 දක්වා) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -44.8% | +12.1% | +7.1% |
| යූරෝ | -41.4% | +7.9% | +9.6% |
| ස්ටර්ලින් පවුම | -38.1% | +6.0% | +6.2% |
| චීන යුවාන් (රෙන්මින්බි) | -39.8% | +14.3% | +9.3% |
| ජපන් යෙන් | -36.4% | +19.5% | +15.8% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -40.8% | +10.8% | +12.9% |
| ඉන්දියානු රුපියල | -38.6% | +12.6% | +7.9% |

* අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+)

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ඉදිරි දින දර්ශනයට අනුව, 2024 වසරේ ජූලි මාසය සඳහා වන විදේශීය අංශයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ පුවත්පත් නිවේදනය 2024 වසරේ අගෝස්තු මස 30 වන දින නිකුත් කරනු ඇත.**

ඇමුණුම I :

**වෙළඳ අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සාරාංශය (අ)**

| කාණ්ඩය | ජූනි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජූනි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන. - ජූනි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන. - ජූනි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 1,005.3 | 1,077.0 | 7.1 | 5,871.0 | 6,144.4 | 4.7 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,369.1 | 1,446.6 | 5.7 | 8,160.5 | 8,684.4 | 6.4 |
| වෙළඳ ශේෂය | -363.7 | -369.6 | | -2,289.5 | -2,540.0 | |
| සේවා ගිණුමේ ශේෂය (ශුද්ධ) | 184.8 | 198.1 | 7.2 | 1,448.5 | 1,813.1 | 25.2 |
| සේවා අංශයට වූ ලැබීම් | 369.5 | 436.2 | 18.0 | 2,435.8 | 3,318.3 | 36.2 |
| *ඒවායින්,* | | | | | | |
| සංචාරක ඉපැයීම් | 122.9 (ආ) | 151.1 (ඇ) | 23.0 | 875.0 (ආ) | 1,556.6 (ඇ) | 77.9 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවා | 69.8 | 68.4 | -2.0 | 384.4 | 394.5 | 2.6 |
| මුහුදු ප්‍රවාහනය | 43.0 | 77.6 | 80.2 | 367.9 | 491.5 | 33.6 |
| ගුවන් ප්‍රවාහනය | 56.5 | 54.3 | -4.0 | 369.0 | 334.3 | -9.4 |
| සේවා අංශයේ ගෙවීම් | 184.7 | 238.0 | 28.9 | 987.3 | 1,505.3 | 52.5 |
| *ඒවායින්,* | | | | | | |
| විදේශ සංචාර | 14.0 | 54.5 | 288.3 | 64.3 | 403.1 | 526.7 |
| මුහුදු ප්‍රවාහනය | 31.7 | 24.2 | -23.6 | 139.4 | 157.3 | 12.8 |
| ගුවන් ප්‍රවාහනය | 30.5 | 40.5 | 33.0 | 233.7 | 226.0 | -3.3 |
| ඉදිකිරීම් සේවා | 9.6 | 20.9 | 117.3 | 56.8 | 64.3 | 13.3 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 475.7 | 519.6 | 9.2 | 2,822.6 | 3,144.0 | 11.4 |
| පුද්ගලික සංක්‍රාම සඳහා ගෙවීම් | 11.3 | 14.1 | 24.3 | 88.6 | 73.9 | -16.6 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -0.9 | -2.9 | | 2.4 | 19.9 | |
| රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ ශුද්ධ විදේශ විනිමය ලැබීම් | 68.2 | -38.7 | | 426.0 | -198.1 | |
| සමස්ත ශේෂය | | | | 1,957.6 | 1,761.1 | |
| ***විශේෂිත අයිතමයන්*** | | | | | | |
| සංචාරක පැමිණීම් | 100,388 | 113,470 | | 624,874 | 1,010,249 | |
| විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් | 24,080 | 24,119 | | 146,812 | 147,160 | |

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) 2023 වසරේ දී සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවත්වනු ලැබූ සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව
(ඇ) 2024 වසරේ දී සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවත්වනු ලැබූ සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව
(ඈ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත්ව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

ඇමුණුම II:

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයට අනුව වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | ජූනි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජූනි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන. - ජූනි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන. - ජූනි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **790.8** | **830.3** | **5.0** | **4,616.0** | **4,837.2** | **4.8** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 40.3 | 51.7 | 28.2 | 248.9 | 312.6 | 25.6 |
| සත්ත්ව ආහාර | 15.4 | 10.2 | -33.8 | 84.2 | 70.1 | -16.7 |
| රෙදිපිළි හා ඇඟලුම් | 430.0 | 447.2 | 4.0 | 2,460.6 | 2,408.1 | -2.1 |
| එයින්, ඇඟලුම් | 393.4 | 409.1 | 4.0 | 2,236.7 | 2,206.3 | -1.4 |
| රෙදිපිළි | 27.8 | 29.0 | 4.3 | 172.4 | 146.6 | -15.0 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 8.8 | 9.1 | 3.2 | 51.5 | 55.2 | 7.3 |
| රබර් නිෂ්පාදිත | 72.1 | 80.9 | 12.2 | 432.6 | 487.1 | 12.6 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 52.4 | 29.9 | -43.0 | 268.8 | 212.8 | -20.9 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 52.9 | 40.1 | -24.1 | 317.6 | 247.1 | -22.2 |
| ප්‍රවාහන උපකරණ | 7.3 | 6.3 | -13.5 | 51.6 | 44.0 | -14.8 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 39.4 | 72.7 | 84.7 | 247.2 | 533.1 | 115.7 |
| රසායනික නිෂ්පාදිත | 15.5 | 19.1 | 23.1 | 95.9 | 110.4 | 15.1 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 8.7 | 10.9 | 24.5 | 57.9 | 63.4 | 9.5 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.8 | 1.8 | -1.7 | 28.2 | 21.1 | -25.2 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 6.3 | 6.6 | 5.9 | 34.1 | 30.5 | -10.7 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 3.8 | 4.2 | 10.4 | 27.0 | 26.5 | -2.0 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 13.3 | 17.4 | 30.4 | 85.5 | 93.3 | 9.2 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 2.9 | 2.6 | -8.4 | 16.3 | 14.3 | -12.3 |
| වෙනත් කාර්මික අපනයන | 28.6 | 28.7 | 0.1 | 159.7 | 163.0 | 2.1 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **211.3** | **242.0** | **14.5** | **1,229.2** | **1,281.0** | **4.2** |
| තේ | 111.5 | 121.7 | 9.2 | 635.5 | 687.0 | 8.1 |
| රබර් | 1.8 | 1.7 | -2.9 | 17.2 | 11.8 | -31.5 |
| පොල් | 28.5 | 33.0 | 15.9 | 161.0 | 191.2 | 18.7 |
| කුළුබඩු | 27.8 | 47.1 | 69.7 | 176.0 | 156.9 | -10.8 |
| එළවළු | 2.2 | 2.9 | 33.2 | 13.9 | 14.3 | 2.6 |
| සකස් නොකළ දුම්කොළ | 1.9 | 1.6 | -17.3 | 12.9 | 11.3 | -12.8 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 19.8 | 13.4 | -32.3 | 80.3 | 80.0 | -0.4 |
| මුහුදු ආහාර | 17.9 | 20.6 | 14.8 | 132.4 | 128.6 | -2.8 |
| **3. ඛනිජ අපනයන** | **1.1** | **2.2** | **98.2** | **11.9** | **12.4** | **4.1** |
| **4. වර්ග නොකළ අපනයන** | **2.1** | **2.5** | **18.0** | **13.9** | **13.8** | **-0.3** |
| **මුළු අපනයන** | **1,005.3** | **1,077.0** | **7.1** | **5,871.0** | **6,144.4** | **4.7** |

(අ) තාවකාලික.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම III:

## සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව අපනයන සංයුතිය (අ)

| කාණ්ඩය | ජූනි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජූනි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන. - ජූනි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන. - ජූනි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **224.8** | **260.6** | **15.9** | **1,315.2** | **1,397.2** | **6.2** |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 21.2 | 25.4 | 19.7 | 151.4 | 152.8 | 1.0 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 6.4 | 5.8 | -9.8 | 34.1 | 36.4 | 6.8 |
| 05 එළවළු හා පලතුරු | 37.1 | 40.9 | 10.2 | 193.6 | 228.6 | 18.1 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 138.8 | 167.9 | 20.9 | 810.2 | 845.1 | 4.3 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **11.6** | **12.8** | **9.9** | **79.4** | **81.7** | **2.9** |
| 11 පාන වර්ග | 4.7 | 5.6 | 20.0 | 34.1 | 39.1 | 14.8 |
| 12 දුම්කොළ හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදිත | 7.0 | 7.2 | 3.2 | 45.3 | 42.6 | -6.1 |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **30.9** | **28.5** | **-7.7** | **192.1** | **189.4** | **-1.4** |
| 23 සකස් නොකළ රබර් | 1.8 | 1.8 | -0.8 | 17.8 | 12.5 | -29.6 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 20.0 | 16.6 | -16.7 | 111.7 | 110.4 | -1.2 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **39.4** | **72.7** | **84.7** | **247.2** | **533.1** | **115.7** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 39.4 | 66.7 | 69.3 | 247.2 | 492.7 | 99.3 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | - | 6.1 | - | - | 40.4 | - |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **5.4** | **7.5** | **39.1** | **31.5** | **38.2** | **21.4** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 5.3 | 7.3 | 38.3 | 31.1 | 36.7 | 18.0 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **20.2** | **23.8** | **18.2** | **117.3** | **132.9** | **13.3** |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **162.9** | **153.3** | **-5.9** | **938.2** | **924.6** | **-1.4** |
| 62 රබර් නිෂ්පාදන (අන් තැනක සඳහන් නොවන) | 53.5 | 57.1 | 6.6 | 322.3 | 364.1 | 13.0 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 33.0 | 36.9 | 11.7 | 200.4 | 192.7 | -3.8 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 57.6 | 35.2 | -38.9 | 298.7 | 240.3 | -19.5 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **58.6** | **45.1** | **-22.9** | **359.4** | **284.5** | **-20.8** |
| 77 විදුලි යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් (අන් තැනක සඳහන් නොවන) | 31.9 | 24.4 | -23.4 | 191.2 | 140.5 | -26.5 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **451.7** | **472.8** | **4.7** | **2,590.6** | **2,562.5** | **-1.1** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 416.3 | 437.0 | 5.0 | 2,367.9 | 2,347.6 | -0.9 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **-** | **-** | **-** | **0.2** | **0.1** | **-5.6** |
| **මුළු අපනයන** | **1,005.3** | **1,077.0** | **7.1** | **5,871.0** | **6,144.4** | **4.7** |

(අ) තාවකාලික.

…සැලකිය යුතු නොවේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017 හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

ඇමුණුම IV:

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයට අනුව වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)**

| කාණ්ඩය | ජුනි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජුනි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන. - ජුනි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන. - ජුනි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **251.7** | **246.9** | **-1.9** | **1,493.5** | **1,534.2** | **2.7** |
| ආහාර හා පාන වර්ග | 146.8 | 142.7 | -2.8 | 845.5 | 843.6 | -0.2 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 15.5 | 5.3 | -65.5 | 64.6 | 57.9 | -10.4 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 19.8 | 15.7 | -20.6 | 132.5 | 101.7 | -23.2 |
| එළවළු (ආ) | 33.7 | 40.2 | 19.0 | 173.0 | 226.1 | 30.7 |
| මුහුදු ආහාර | 6.3 | 13.1 | 107.9 | 25.9 | 61.9 | 139.2 |
| සීනි හා රසකැවිලි | 30.4 | 33.8 | 11.2 | 250.9 | 160.3 | -36.1 |
| කුළුබඩු | 7.1 | 6.1 | -14.4 | 61.3 | 54.8 | -10.7 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 34.0 | 28.4 | -16.3 | 137.3 | 180.8 | 31.7 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 104.9 | 104.2 | -0.7 | 648.0 | 690.7 | 6.6 |
| පෞද්ගලික රථවාහන | 1.4 | 5.8 | 304.3 | 14.0 | 28.7 | 105.4 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 58.0 | 43.2 | -25.5 | 364.4 | 269.3 | -26.1 |
| ගෘහ උපකරණ | 3.9 | 10.9 | 176.5 | 23.7 | 70.8 | 199.0 |
| රෙදිපිළි හා උපාංග | 14.1 | 14.7 | 4.2 | 85.3 | 99.0 | 16.0 |
| විදුලි සංදේශ උපකරණ | 7.7 | 7.2 | -6.4 | 31.3 | 57.4 | 83.6 |
| ගෘහ හා දැව භාණ්ඩ | 6.7 | 6.9 | 2.7 | 45.2 | 58.0 | 28.3 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 13.0 | 15.5 | 19.1 | 84.1 | 107.4 | 27.8 |
| **2. අන්තර් භාණ්ඩ** | **875.4** | **927.4** | **5.9** | **5,446.5** | **5,634.2** | **3.4** |
| ඉන්ධන | 290.0 | 365.4 | 26.0 | 2,354.8 | 2,209.2 | -6.2 |
| එයින්, බොරතෙල් | 66.6 | 68.3 | 2.5 | 559.9 | 506.3 | -9.6 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 223.2 | 297.0 | 33.1 | 1,456.1 | 1,532.5 | 5.3 |
| ගල්අඟුරු | 0.2 | 0.1 | -25.2 | 338.9 | 170.4 | -49.7 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 25.1 | 22.7 | -9.4 | 135.8 | 128.9 | -5.1 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 194.1 | 233.3 | 20.2 | 1,194.0 | 1,327.5 | 11.2 |
| කඩදාසි හා ඝන කඩදාසි | 32.0 | 33.8 | 5.5 | 205.4 | 209.1 | 1.8 |
| කෘෂිකාර්මික යෙදවුම් | 19.1 | 22.8 | 19.1 | 125.8 | 126.2 | 0.4 |
| තිරිඟු හා ඉරිඟු | 41.1 | 11.8 | -71.2 | 188.0 | 134.9 | -28.3 |
| මූල ලෝහ | 82.2 | 38.6 | -53.0 | 173.3 | 232.5 | 34.1 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 37.0 | 42.2 | 14.1 | 217.0 | 268.2 | 23.6 |
| රසායනික නිෂ්පාදිත | 63.5 | 68.2 | 7.4 | 384.9 | 464.3 | 20.6 |
| පොහොර | 25.3 | 5.5 | -78.1 | 86.9 | 47.4 | -45.4 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 15.1 | 23.7 | 56.4 | 83.6 | 132.7 | 58.8 |
| ඛනිජ නිෂ්පාදිත | 4.3 | 9.9 | 130.2 | 32.9 | 58.7 | 78.3 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 46.6 | 49.3 | 6.0 | 264.0 | 294.5 | 11.5 |
| **3. ආයෝජන භාණ්ඩ** | **239.9** | **272.3** | **13.5** | **1,211.2** | **1,510.9** | **24.7** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 163.7 | 187.2 | 14.4 | 822.4 | 1,020.2 | 24.0 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 69.4 | 74.5 | 7.4 | 350.0 | 428.3 | 22.3 |
| ප්‍රවාහන උපකරණ | 6.6 | 10.4 | 57.6 | 37.4 | 61.3 | 63.9 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.2 | 0.1 | -35.8 | 1.3 | 1.1 | -15.7 |
| **4. වර්ග නොකළ ආනයන** | **2.1** | **0.1** | **-95.6** | **9.4** | **5.0** | **-46.5** |
| **මුළු ආනයන** | **1,369.1** | **1,446.6** | **5.7** | **8,160.5** | **8,684.4** | **6.4** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **1,079.1** | **1,081.2** | **0.2** | **5,805.7** | **6,475.2** | **11.5** |

(අ) තාවකාලික.
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම V:

**සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව ආනයන සංයුතිය (අ)**

| කාණ්ඩය | ජුනි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජුනි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන. - ජුනි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන. - ජුනි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **191.3** | **167.3** | **-12.5** | **1,119.8** | **1,051.9** | **-6.1** |
| 02 කිරි ආශ්‍රිත නිෂ්පාදිත හා කුරුලු බිත්තර | 20.5 | 15.7 | -23.3 | 134.6 | 107.8 | -19.9 |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 6.4 | 13.4 | 109.4 | 26.4 | 62.7 | 137.3 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 56.3 | 16.7 | -70.3 | 252.0 | 191.0 | -24.2 |
| 05 එළවළු හා පලතුරු | 36.4 | 44.6 | 22.5 | 194.1 | 260.5 | 34.2 |
| 06 සීනි, සීනි ආශ්‍රිත සැකසුම් හා පැණි | 30.4 | 33.8 | 11.2 | 250.9 | 160.3 | -36.1 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 10.8 | 11.8 | 9.1 | 82.9 | 83.8 | 1.0 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **8.8** | **13.6** | **55.4** | **57.5** | **55.3** | **-3.9** |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **25.8** | **32.3** | **25.3** | **145.9** | **198.0** | **35.7** |
| 23 සකස් නොකළ රබර් | 12.7 | 20.1 | 58.6 | 62.8 | 109.7 | 74.5 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 1.7 | 0.8 | -49.5 | 21.4 | 7.9 | -63.2 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **290.0** | **365.4** | **26.0** | **2,354.8** | **2,209.2** | **-6.2** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 275.2 | 332.5 | 20.8 | 1,889.2 | 1,867.9 | -1.1 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 14.6 | 32.8 | 125.2 | 126.8 | 170.9 | 34.8 |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **25.6** | **15.6** | **-39.0** | **81.9** | **98.4** | **20.3** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 24.7 | 14.4 | -41.6 | 77.2 | 91.5 | 18.5 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **185.5** | **153.3** | **-17.4** | **1,033.1** | **1,026.9** | **-0.6** |
| 54 බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 54.5 | 38.3 | -29.6 | 341.6 | 244.6 | -28.4 |
| 56 පොහොර | 25.3 | 5.5 | -78.1 | 86.8 | 46.9 | -45.9 |
| 57 ප්‍රාථමික ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 23.4 | 28.0 | 19.6 | 137.1 | 181.3 | 32.2 |
| 58 ප්‍රාථමික නොවන ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 15.2 | 10.2 | -33.0 | 66.3 | 64.8 | -2.2 |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **402.4** | **414.5** | **3.0** | **2,092.5** | **2,407.2** | **15.0** |
| 64 කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 31.4 | 31.8 | 1.4 | 198.9 | 199.1 | 0.1 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 189.1 | 228.4 | 20.8 | 1,154.0 | 1,298.5 | 12.5 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 40.8 | 41.4 | 1.4 | 236.4 | 262.8 | 11.1 |
| 67 යකඩ හා වානේ | 94.0 | 57.2 | -39.2 | 218.1 | 311.0 | 42.6 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **180.1** | **223.8** | **24.2** | **921.7** | **1,247.1** | **35.3** |
| 72 ඇතැම් කර්මාන්ත සඳහා විශේෂයෙන් සකස් කරන ලද යන්ත්‍රසූත්‍ර | 17.8 | 28.2 | 58.4 | 110.3 | 171.6 | 55.5 |
| 74 සාමාන්‍ය කාර්මික යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ යන්ත්‍ර කොටස් (අන් තැනක සඳහන් නොවන) | 26.4 | 69.8 | 164.5 | 159.9 | 285.8 | 78.7 |
| 75 කාර්යාලයීය යන්ත්‍රසූත්‍ර හා ස්වයංක්‍රිය දත්ත සැකසුම් යන්ත්‍ර | 13.7 | 8.3 | -39.4 | 64.8 | 77.2 | 19.1 |
| 76 විදුලි සන්දේශ සහ ශබ්ද පටිගත කිරීම හා ප්‍රතිනිෂ්පාදන කටයුතු සඳහා යොදාගනු ලබන උපකරණ | 26.0 | 29.2 | 12.5 | 104.6 | 171.1 | 63.5 |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග (අන් තැනක සඳහන් නොවන) සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් | 43.5 | 42.0 | -3.3 | 266.7 | 267.9 | 0.5 |
| 78 රථවාහන | 11.0 | 16.1 | 46.9 | 68.4 | 95.6 | 39.7 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **58.3** | **60.5** | **3.8** | **345.3** | **387.2** | **12.1** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 11.8 | 11.7 | -0.4 | 75.9 | 86.0 | 13.3 |
| 87 වෘත්තීමය, විද්‍යාත්මක හා පාලන මෙවලම් සහ උපකරණ (අන් තැනක සඳහන් නොවන) | 11.5 | 11.4 | -0.6 | 69.0 | 70.9 | 2.7 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **1.3** | **0.2** | **-86.3** | **7.9** | **3.2** | **-59.3** |
| **මුළු ආනයන** | **1,369.1** | **1,446.6** | **5.7** | **8,160.5** | **8,684.4** | **6.4** |

(අ) තාවකාලික.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017හි විශේෂ සටහන 04 බලන්න.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

ඇමුණුම VI:

## සේවා ගිණුම - ලැබීම් (අ)

| | ජූනි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජූනි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.-ජූනි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.-ජූනි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **සේවා** | **369.5** | **436.2** | **18.0** | **2,435.8** | **3,318.3** | **36.2** |
| **නිෂ්පාදන සේවා** | **1.1** | **4.4** | **280.5** | **8.9** | **19.9** | **122.9** |
| **නඩත්තු සහ අලුත්වැඩියා සේවා** | **3.8** | **3.4** | **-9.9** | **20.4** | **28.4** | **39.0** |
| **ප්‍රවාහනය** | **99.6** | **131.8** | **32.4** | **737.0** | **826.2** | **12.1** |
| මුහුදු ප්‍රවාහනය | 43.0 | 77.6 | 80.2 | 367.9 | 491.5 | 33.6 |
| මගී ගාස්තු | 0.012 | 0.0 | 255.4 | 0.06 | 1.0 | |
| නැව් කුලී | 21.5 | 42.7 | 99.0 | 185.8 | 293.6 | 58.0 |
| වෙනත් | 21.6 | 34.8 | 61.5 | 182.0 | 196.8 | 8.1 |
| ගුවන් ප්‍රවාහනය | 56.5 | 54.3 | -4.0 | 369.0 | 334.3 | -9.4 |
| මගී ගාස්තු | 27.4 | 19.1 | -30.2 | 155.2 | 141.5 | -8.8 |
| ගුවන් කුලී | 3.9 | 4.5 | 14.3 | 41.2 | 27.1 | -34.2 |
| වෙනත් | 25.2 | 30.7 | 21.6 | 172.7 | 165.7 | -4.0 |
| තැපැල් සේවා | 0.04 | 0.02 | -52.1 | 0.13 | 0.5 | 270.0 |
| **සංචාරක** | **122.9** | **151.1** | **23.0** | **875.0** | **1,556.6** | **77.9** |
| **ඉදිකිරීම්** | **19.5** | **17.3** | **-11.3** | **122.9** | **117.1** | **-4.7** |
| විදේශයන්හි ඉදිකිරීම් | 3.6 | 0.6 | -83.9 | 15.4 | 12.6 | -18.2 |
| දේශීය ඉදිකිරීම් | 11.4 | 10.8 | -5.7 | 60.7 | 53.7 | -11.6 |
| ගෘහ නිර්මාණ, ඉංජිනේරු සහ අනෙකුත් තාක්ෂණික සේවා | 4.4 | 5.9 | 33.5 | 46.8 | 50.8 | 8.7 |
| **රක්ෂණ හා විශ්‍රාම වැටුප්** | **2.8** | **3.0** | **7.9** | **16.4** | **15.1** | **-7.9** |
| සෘජු රක්ෂණය | 2.3 | 3.0 | 30.4 | 15.4 | 12.8 | -17.2 |
| ප්‍රතිරක්ෂණය | 0.5 | 0.0 | -95.3 | 1.0 | 2.3 | 139.0 |
| **මූල්‍ය සේවා** | **3.9** | **7.2** | **82.4** | **31.3** | **37.9** | **20.8** |
| **බුද්ධිමය දේපල භාවිතය සඳහා ගාස්තු** | **2.0** | **0.6** | **-68.0** | **6.8** | **4.8** | **-29.5** |
| **විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවා** | **77.3** | **74.2** | **-4.1** | **452.2** | **470.1** | **4.0** |
| විදුලි සංදේශ සේවා | 7.5 | 5.7 | -23.5 | 67.8 | 75.6 | 11.5 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම් යන සේවා | 69.8 | 68.4 | -2.0 | 384.4 | 394.5 | 2.6 |
| පරිගණක සේවා | 69.3 | 67.8 | -2.2 | 380.3 | 391.6 | 3.0 |
| තොරතුරු සේවා | 0.5 | 0.7 | 37.8 | 4.2 | 3.0 | -29.1 |
| **වෙනත් ව්‍යාපාරික සේවා** | **33.3** | **35.6** | **7.0** | **144.1** | **218.5** | **51.6** |
| පර්යේෂණ සහ සංවර්ධන සේවා | 1.0 | 4.8 | 359.1 | 9.1 | 22.5 | 148.6 |
| වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා | 18.7 | 14.0 | -25.4 | 55.0 | 81.3 | 47.8 |
| තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ වෙනත් ව්‍යාපාරික සේවා | 13.5 | 16.8 | 24.9 | 80.1 | 114.7 | 43.2 |
| **පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා** | **2.6** | **2.7** | **5.8** | **17.2** | **12.5** | **-27.0** |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය සහ ඊට අදාළ සේවා | 0.1 | 1.3 | | 0.8 | 4.1 | 399.5 |
| වෙනත් පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා | 2.5 | 1.5 | -41.6 | 16.4 | 8.4 | -48.4 |
| **රජයේ භාණ්ඩ හා සේවා වියදම්** | **0.8** | **4.9** | **490.5** | **3.4** | **11.2** | **228.7** |

(අ) තාවකාලික. සංචාරක ඉපැයීම් හැර අනෙකුත් සියලුම දත්ත අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ දත්ත මත පදනම් වේ. සංචාරක ඉපැයීම් දත්ත, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් කරන ලද සමීක්ෂණය මත පදනම් වේ.

**මූලයන්**: අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

ඇමුණුම VII:

## සේවා ගිණුම - ගෙවීම් (අ)

| | ජූනි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජූනි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.-ජූනි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.-ජූනි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **සේවා** | **184.7** | **238.0** | **28.9** | **987.3** | **1,505.3** | **52.5** |
| **නිෂ්පාදන සේවා** | **20.0** | **17.3** | **-13.7** | **101.2** | **120.2** | **18.8** |
| **නඩත්තු සහ අලුත්වැඩියා සේවා** | **0.7** | **2.4** | **263.2** | **2.7** | **6.9** | **153.8** |
| **ප්‍රවාහනය** | **62.2** | **65.0** | **4.5** | **373.9** | **386.1** | **3.3** |
| මුහුදු ප්‍රවාහනය | 31.7 | 24.2 | -23.6 | 139.4 | 157.3 | 12.8 |
| මගී ගාස්තු | 0.2 | 0.143 | -20.9 | 0.9 | 0.4 | -56.0 |
| නැව් කුලී | 27.7 | 22.7 | -17.8 | 118.2 | 150.0 | 26.9 |
| වෙනත් | 3.9 | 1.4 | -65.0 | 20.3 | 6.9 | -66.2 |
| ගුවන් ප්‍රවාහනය | 30.5 | 40.5 | 33.0 | 233.7 | 226.0 | -3.3 |
| මගී ගාස්තු | 17.8 | 19.1 | 7.4 | 130.2 | 133.5 | 2.5 |
| ගුවන් කුලී | 4.4 | 8.8 | 97.4 | 44.4 | 34.1 | -23.2 |
| වෙනත් | 8.3 | 12.7 | 53.5 | 59.1 | 58.4 | -1.2 |
| තැපැල් සේවා | - | 0.2 | | 0.7 | 2.8 | 280.4 |
| **සංචාරක** | **14.0** | **54.5** | **288.3** | **64.3** | **403.1** | **526.7** |
| **ඉදිකිරීම්** | **9.6** | **20.9** | **117.3** | **56.8** | **64.3** | **13.3** |
| විදේශයන්හි ඉදිකිරීම් | 0.02 | 11.1 | | 1.1 | 20.8 | |
| දේශීය ඉදිකිරීම් | 5.7 | 4.5 | -22.2 | 35.8 | 10.7 | -70.2 |
| ගෘහ නිර්මාණ, ඉංජිනේරු සහ අනෙකුත් තාක්ෂණික සේවා | 3.8 | 5.3 | 39.0 | 19.8 | 32.8 | 65.5 |
| **රක්ෂණ හා විශ්‍රාම වැටුප්** | **5.2** | **4.1** | **-19.9** | **21.0** | **29.2** | **39.2** |
| සෘජු රක්ෂණය | 2.0 | 0.8 | -59.2 | 4.9 | 6.2 | 26.0 |
| ප්‍රතිරක්ෂණය | 3.1 | 3.3 | 5.3 | 16.1 | 23.0 | 43.3 |
| **මූල්‍ය සේවා** | **3.4** | **1.9** | **-43.6** | **26.0** | **42.7** | **63.9** |
| **බුද්ධිමය දේපල භාවිතය සඳහා ගාස්තු** | **6.8** | **8.4** | **24.5** | **33.5** | **60.4** | **80.0** |
| **විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවා** | **30.8** | **23.1** | **-25.0** | **133.0** | **118.8** | **-10.7** |
| විදුලි සංදේශ සේවා | 8.4 | 10.9 | 29.9 | 22.7 | 28.0 | 23.4 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවා | 22.4 | 12.1 | -45.7 | 110.3 | 90.8 | -17.7 |
| පරිගණක සේවා | 18.9 | 9.9 | -47.5 | 77.5 | 76.1 | -1.8 |
| තොරතුරු සේවා | 3.5 | 2.2 | -36.2 | 32.8 | 14.7 | -55.2 |
| **වෙනත් ව්‍යාපාරික සේවා** | **30.5** | **39.7** | **30.2** | **163.3** | **264.6** | **62.0** |
| පර්යේෂණ සහ සංවර්ධන සේවා | 6.0 | 9.8 | 61.8 | 35.9 | 47.4 | 32.0 |
| වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා | 10.1 | 10.7 | 6.3 | 55.6 | 94.5 | 70.1 |
| තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ වෙනත් ව්‍යාපාරික සේවා | 14.4 | 19.2 | 33.6 | 71.9 | 122.7 | 70.8 |
| **පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා** | **0.43** | **0.4** | **-10.2** | **6.2** | **7.4** | **20.5** |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය සහ ඊට අදාළ සේවා | 0.1 | 0.3 | 89.6 | 3.92 | 7.0 | 79.5 |
| වෙනත් පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා | 0.3 | 0.1 | -60.7 | 2.3 | 0.4 | -82.2 |
| **රජයේ භාණ්ඩ හා සේවා වියදම්** | **1.13** | **0.4** | **-67.2** | **5.4** | **1.5** | **-71.4** |

(අ) තාවකාලික

**මූලය:** අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම VIII:

## සේවා ගිණුම - ශුද්ධ (අ)

| | ජූනි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජූනි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.-ජූනි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.-ජූනි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **සේවා** | **184.8** | **198.1** | **7.2** | **1,448.5** | **1,813.1** | **25.2** |
| **නිෂ්පාදන සේවා** | **-18.9** | **-12.9** | **-31.6** | **-92.2** | **-100.3** | **8.8** |
| **නඩත්තු සහ අලුත්වැඩියා සේවා** | **3.1** | **1.0** | **-67.3** | **17.7** | **21.5** | **21.4** |
| **ප්‍රවාහනය** | **37.4** | **66.9** | **78.7** | **363.2** | **440.1** | **21.2** |
| මුහුදු ප්‍රවාහනය | 11.3 | 53.3 | 371.5 | 228.5 | 334.2 | 46.2 |
| මගී ගාස්තු | -0.2 | -0.1 | -41.2 | -0.9 | 0.6 | -169.5 |
| නැව් කුලී | -6.2 | 20.0 | -421.2 | 67.7 | 143.6 | 112.2 |
| වෙනත් | 17.7 | 33.4 | 89.1 | 161.7 | 190.0 | 17.5 |
| ගුවන් ප්‍රවාහනය | 26.1 | 13.7 | -47.3 | 135.2 | 108.3 | -19.9 |
| මගී ගාස්තු | 9.6 | 0.0 | -99.6 | 25.0 | 8.0 | -67.8 |
| ගුවන් කුලී | -0.52 | -4.3 | 726.8 | -3.2 | -7.0 | 117.9 |
| වෙනත් | 17.0 | 18.0 | 6.1 | 113.5 | 107.3 | -5.5 |
| තැපැල් සේවා | 0.04 | -0.2 | -618.0 | -0.6 | -2.3 | 282.5 |
| **සංචාරක** | **108.8** | **96.6** | **-11.3** | **810.7** | **1,153.5** | **42.3** |
| **ඉදිකිරීම්** | **9.9** | **-3.6** | **-136.6** | **66.1** | **52.9** | **-20.1** |
| විදේශයන්හි ඉදිකිරීම් | 3.6 | -10.5 | -392.2 | 14.3 | -8.2 | -157.0 |
| දේශීය ඉදිකිරීම් | 5.7 | 6.3 | 10.9 | 24.9 | 43.0 | 73.0 |
| ගෘහ නිර්මාණ, ඉංජිනේරු සහ අනෙකුත් තාක්ෂණික සේවා | 0.6 | 0.6 | -2.5 | 26.9 | 18.0 | -33.1 |
| **රක්ෂණ හා විශ්‍රාම වැටුප්** | **-2.4** | **-1.1** | **-52.8** | **-4.6** | **-14.1** | |
| සෘජු රක්ෂණය | 0.3 | 2.2 | 680.8 | 10.5 | 6.6 | -37.3 |
| ප්‍රතිරක්ෂණය | -2.6 | -3.3 | 24.4 | -15.1 | -20.7 | 37.2 |
| **මූල්‍ය සේවා** | **0.5** | **5.3** | | **5.3** | **-4.8** | **-190.7** |
| **බුද්ධිමය දේපල භාවිතය සඳහා ගාස්තු** | **-4.8** | **-7.8** | **62.4** | **-26.8** | **-55.6** | **107.7** |
| **විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවා** | **46.5** | **51.1** | **9.8** | **319.3** | **351.3** | **10.0** |
| විදුලි සංදේශ සේවා | -0.9 | -5.2 | 461.6 | 45.1 | 47.6 | 5.5 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවා | 47.4 | 56.3 | 18.7 | 274.1 | 303.7 | 10.8 |
| පරිගණක සේවා | 50.4 | 57.8 | 14.7 | 302.8 | 315.5 | 4.2 |
| තොරතුරු සේවා | -3.0 | -1.6 | -47.9 | -28.6 | -11.7 | -59.0 |
| **වෙනත් ව්‍යාපාරික සේවා** | **2.7** | **-4.2** | **-252.2** | **-19.2** | **-46.1** | **140.6** |
| පර්යේෂණ සහ සංවර්ධන සේවා | -5.0 | -5.0 | 0.0 | -26.8 | -24.9 | -7.3 |
| වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා | 8.7 | 3.3 | -62.3 | -0.6 | -13.2 | |
| තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ වෙනත් ව්‍යාපාරික සේවා | -0.9 | -2.4 | 160.9 | 8.3 | -8.0 | -197.2 |
| **පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා** | **2.2** | **2.4** | **9.0** | **11.0** | **5.1** | **-53.7** |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය සහ ඊට අදාළ සේවා | 0.0 | 1.0 | | -3.1 | -2.9 | -5.1 |
| වෙනත් පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා | 2.2 | 1.3 | -39.1 | 14.1 | 8.0 | -43.0 |
| **රජයේ භාණ්ඩ හා සේවා වියදම්** | **-0.3** | **4.6** | | **-2.0** | **9.6** | **-578.3** |

(අ) තාවකාලික

**මූලය:** අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව